සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

සතිය - 3

විෂය - බුද්ධ ධර්මය

ශ්‍රේණිය - 5

2021 දෙසැම්බර් මාසය

සැකසුම : තමරා දර්ශනී - බලන්ගොඩ අධ්‍යාපන කලාපය

# 24.පාඩම.සෝමාවතී දාගැබ

ආදරණීය දුවේ පුතේ ගිය සතියෙ අපි සුමන සමන් දෙවියන් විසින් කේෂ ධාතු නිදන් කොට ඉදුනිල් මිණියෙන් සත්රියන් උසට සාදවන ලද මහියංගණ දාගැබ පිළිබඳ ඉගෙන ගත්තානේ.

ඉතින් මම අද ඔයාලව එක්ක යන්නේ තවත් එවැනිම දාගැබක් වන්දනා කරන්නයි.ඔයාල ඉතින් ආසයිනෙ ඒ වගේ වන්දනා ගමන් යන්න.අපේ රටේ ඓතිහාසික සිද්ධස්ථාන අතර අද්විතීය ස්ථානය හිමිවන සෝමාවතී දාගැබ නරඹන්න අපි දැන් සූදානම් වෙමු.

එහෙනම් මගෙ පුතේ බුද්ධ ධර්මය පෙළ පොතේ 24 වන පාඩම පෙරලගන්නකෝ.ඔයාලා ආසයි නේද මේ දාගැබ හැදුවේ කවුද? තියෙන්නේ කොහේද? ඇයි මේ නම ලැබුණේ ,නිදන් කරල තියෙන්නේ මොනවද වගේ තොරතුරු දැන ගන්න.එහෙනම් මගෙ පුතේ දැන් අපි එළිමහනට ගිහින් සුදුසු තැනක වාඩිවෙලා පාඩම හඩනගා කියවමු නේද?

දැන් අපි ප්‍රශ්න ටිකකට පිළිතුරු ලියමුකෝ.

1) දුටුගැමුණු රජතුමාගේ පියා කවුද ?

2) සෝමා දේවිය විවාහ වූයේ කවුරුන් සමගද?

3) එකළ සේරු නුවර රජ කළේ කවුද?

4) ගිරි අභය රජු තම දේවිය නමින් කරවූයේ කුමක්ද?

5) සෝමාවතී දාගැබේ නිදන් කළේ කුමක්ද?

ඉතින් දුවේ පුතේ අද අපි සෝමාවතී චෛත්‍ය පිළිබඳ ඉගෙන ගත්තානේ.දැන් එහෙනම් ලංකා සිතියමක් අරගෙන සෝමාවතී චෛත්‍ය පිහිටි ස්ථානය ලකුණු කරමු නේද ?